# අඩිපාරවල් මගින් හෙළිවන කඳුකර ප්‍රදේශයේ පුරාණ ගමන් මාර්ග

ඩී. ජේ. කේ. ඉහළගෙදර[1]

**සංක්ෂේපය**

"අඩිපාර" යනු පුරාණයේ පටන් මේ වන තෙක් ම ගමනාගමනය සඳහා අතිශයින් ප්‍රයෝජනවත් මාර්ග විශේෂයකි. ගැමියෝ වඩා කිට්ටු යැයි සැළකූ අඩි පාරවල් ඔස්සේ පයින් ගමන් කරමින් තමන්ගේ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට පෙළඹී සිටියහ. තැනිතලා බිම්, ගල් තලාවන්, කඳු හෙල්, බෑවුම් අතරින් අඩි පාරවල් සකස් විය. මගියන්ට පයින් ගමන් කිරීමට පමණක් ප්‍රමාණවත් වූ අඩි පාරවල් ලෙසින් ව්‍යවහාර වන මාර්ග පුරාණයේ දී හඳුන්වා ඇත්තේ "ඒකපදික මග්ග" යනුවෙනි. පෙත් මග සහ පා මංකඩ යනුවෙන් ද අඩිපාර ව්‍යවහාර වේ. මිනිසා පහසුවෙන් හා කෙටි මගින් අවශ්‍ය තැනට නිතර නිතර ගමන් කිරීම තුළ අඩි පාරවල් නිර්මාණය වී තිබේ. එය කිසිවෙකු විසින් එළිපෙහෙළි කරන ලද හෝ ක්‍රමානුකූලව තනවන ලද මාර්ගයක් නොවීය. ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශය ආශ්‍රිත ව පුරාණයේ පැවති බවට සාක්ෂි හමුවන එවැනි අඩි පාරවල් ද කඳුකරයේ විවිධ ප්‍රදේශවලට ගමන් කිරීමට සඳහා නිර්මාණය වූ ඒවා විය. මෙම ඉදිරිපත් කිරීම මගින් කඳුකර ප්‍රදේශය ආශ්‍රිත ව පැවති පුරාණ අඩිපාරවල්හි උපයෝගිතාව හඳුනාගැනීමට උත්සහාගනු ලබයි. මහනුවර යුගයේ දී කොළඹ සිට සෙංකඩගල රාජධානියේ තෙක් දිවුණු මාර්ගය ද අඩි පාරක ස්වරූපයෙන් පැවතුනක් විය. එය හංවැල්ල, සීතාවක, රුවන්වැල්ල, අරන්දර, අටුගොඩ, ඇවුණුගල්ල, දීවෙල, අට්ටාපිටිය, අලුත්නුවර, පහළ කඩුගන්නාව හරහා දිවුණු මාර්ගයක් විය. එම මාර්ගය ආශ්‍රිත ව ඉදිකර තිබුණු පුරාණ අම්බලම් කිහිපයක සාක්ෂි වර්තමානයේ ද දක්නට ලැබීමෙන් එම ගමන් මගතහවුරු වේ. එම අඩි පාර පැවතියේ ස්වාභාවික ජල මාර්ගයකට ආසන්නයෙන් බව හඳුනාගැනීමට පුළුවන. බදුල්ල සිට මහනුවර බලා ගමන් ගත් මාර්ගය ද පුරාණයේ අඩි පාරක් විය. පුස්කොළ ලේඛන සහ ජන කවි ඇසුරින් එම මාර්ගය පිළිබඳ ව වටහාගත හැකි ය. අලුත්වෙල, කොහොල්විලකඳුර, කහටගහරුප්ප, කන්දේගෙදර, බෝගොඩ, සිහිල්පැන්කඳුර, පරණගම හරහා මෙම මාර්ගය වැටී තිබිණ. ගමන් මගේ ඇතැම් ස්ථානවල දැව පාලම් ආදිය තනා තිබුණ අතර පුරාණ බෝගොඩ ලී පාලම එහි එක් සාධකයක් විය. මීට අමතරව මහනුවර රාජධානියේ සිට හඟුරන්කෙත හෙවත් දියතිලකනුවර තෙක් විහිදුණු තවත් අඩිපාරක් තිබුණු බවට සාක්ෂි පවතී. හඟුරන්කෙත ප්‍රදේශය රජවරුන්ගේ ආරක්ෂිත ප්‍රදේශයක් වීම මෙම මාර්ගය නිර්මාණය වීමට හේතු වන්නට ඇත. දියතිලකනුවර සිට මතුරට දක්වා දිවුණු තවත් මාර්ගයක් වූ අතර එය ද අඩිපාරක් විය.

***මුඛ්‍ය පදඃ*** *අඩිපාර, අම්බලම්, ගමනාගමනය, ජන කවි, මහනුවර*

[1] සමාජීයවිද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

ihalagedara@yahoo.com